# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/31 - 2022 අගෝස්තු මස 17 වැනි බදාදා - 2022.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉ. අ. යොමු අංකය :* 4-3/6/2019/එච්ඩබ්/418.

*මගේ අංකය :* 14/2021.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 348, කහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කහවත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 291, අතිරේක අංක 34, පත්‍ර අංක 25 හා 2021.07.28 දිනැති සැලැස්මේ කැබලි අංක 969 ලෙස පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0886 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස:

01. **කැබලි අංක 969**

ඉඩමේ නම: හතමුනිගෙවත්ත; ඉඩමේ විස්තරය: වත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මුතුකුමාරන වගාඅච්චිගේ මහින්ද ( ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0886.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අගෝස්තු මස 31 දින, පූ.භා. 10.00ට බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 අගෝස්තු මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් හා,
අත්කර ගැනීමේ නිලධාරි,
බෙලිඅත්ත.

2022 ජුනි මස 21 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
බෙලිඅත්ත.

EOG 08-0154


G 37262 - 16 (2022/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.